Australian Government

COVID-19 VACCINATION

# කෝවිඩ්-19 ආසාදනයේ දීර්ඝ කාලීන බලපෑම්

කෝවිඩ්-19 ආසාදනය වන බොහෝ අය තුල කෙටි කාලයක් රෝග ලක්‍ෂණ තිබෙන අතර සති කිහිපයකදී සුවය ලබයි. කෝවිඩ්-19 හේතුවෙන් සුවවීමට ගතවන කාලය එක් එක් පුද්ගලයා අනුව වෙනස්වේ. මෙය තීරණය වන්නේ කෝවිඩ්-19 හේතුවෙන් ඔබ කොතරම් අසනීප වුණිද යන්න මතය. ඔබට වෙනත් පවතින රෝගී තත්වයන් ඇතිද යන්න මතද මෙය තීරණයවේ.

කෝවිඩ්-19 ආසාදනය වුණු පසු දීර්ඝ කාලීන සෞඛ්‍යය ගැටළු ඇති අයද සිටී. සමහර අවස්ථාවල කෝවිඩ්-19 ආසාදනය හේතුවෙන් මුලින් අසනීප වීමෙන් පසු මාස කිහිපයක් අසනීපවී සිටින අවස්ථාද ඇත. මෙය දීර්ඝ කාලීන කෝවිඩ් ආසාදන (Long COVID) ලෙස හඳුන්වයි. දීර්ඝ කාලීන කෝවිඩ් ආසාදනය වන අය තුල තව දුරටත් වයිරසය නැති වුවද, සති හෝ මාස ගණනක් අසනීපවී සිටිය හැකිය.

ඉතාම අඩු ආකාරයට කෝවිඩ්-19 ආසාදනයවී රෝහලට නොගිය අය තුලද දීර්ඝ කාලීන කෝවිඩ් ආසාදන පැවතිය හැක.

## දීර්ඝ කාලීන කෝවිඩ් ආසාදනයේ රෝග ලක්‍ෂණ

මුලින් ආසාදනය වීමෙන් අනතුරුව දිගටම පැවතිය හැකි බහුල සළකුණු සහ රෝග ලක්‍ෂණ අතර පහත දේ ඇත:

- වෙහෙසකර බව
- හුස්ම ගැනීමේ අපහසුව
- දිගටම පවතින කැස්ස
- පපුවේ වේදනාව
- හන්දිපත් රුදාව
- ව්‍යායාම කිරීමට ප්‍රමාණවත් නොවන ශක්තිය
- උණ
- හිසේ කැක්කුම
- මතකය සහ පැහැදිලිව සිතීම පිළිබඳ ගැටළු (‘brain fog’)
- විෂාදය හෝ උත්සුක බව (depression, anxiety).

කෝවිඩ්-19 හේතුවෙන් ඇතිවිය හැකි බොහෝමයක් අතුරු ආබාධ සම්බන්ධ අවබෝධයක් තවම නැත. මේ හේතුව නිසා ඔබට කෝවිඩ්-19 ආසාදනයවීමෙන් ආරක්‍ෂාවීම සම්බන්ධ සියළු පියවර ගැනීම වැදගත්වේ.

කෝවිඩ්-19 ආසාදනයවීමේ අවදානම අඩු කර ගැනීම සඳහා හොඳම ක්‍රමය එන්නත ලබා ගැනීමවේ.

කෝවිඩ්-19 ආසාදනයට එරෙහිව බොහෝ දෙනා එන්නත ලබා ගත් පසු, එය ප්‍රජාව තුල පැතිර යාමේ අවදානම අඩුවේ. මේ හේතුවෙන් කෝවිඩ්-19 ආසාදනය වන අයගේ ප්‍රමාණය අඩුවන අතර මේ මගින් දීර්ඝ කාලීන කෝවිඩ් ආසාදනය වන අයගේ සංඛ්‍යාවද අඩුවේ.

## වැඩිදුර විස්තර සඳහා

ඔබට කිසියම් ගැටළුවක් ඇතිනම්, ඔබගේ වෛද්‍යවරයා සමඟ කථා කරන්න, [health.gov.au/covid19-vaccines-languages](https://www.health.gov.au/covid19-vaccines-languages) වෙබ් අඩවිය වෙත පිවිසෙන්න, නැතිනම් දුරකථන අංක 1800 020 080 ඔස්සේ ජාතික කොරෝනා වයිරස් උපකාර අංකය අමතන්න. භාෂා පරිවර්තන සේවා සඳහා දුරකථන අංක 131 450 අමතන්න.